# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No.    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date: 2022-12-21

| | | | |
|---|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | 01. | අයි.ජී. චමින්ද කුමාර මයා, අංක 124, නව නගරය, දිගන, රජවැල්ල. |
| | | 02. | ඊ.ජී පොඩිමහත්තයා මයා, අංක 3/10, ගෝනවල, රජවැල්ල. |
| | | 03. | එම්.බී.එස්.එන් පීරිස් මයා, අංක 30, දොස්තරවත්ත, ගෝනවල, රජවැල්ල. |
| | | 04. | එච්.එම්.බී කුමාරි හේරත් මිය, යාපා නිවන, ගොමගොඩ, දිගන. |
| | | 05. | කේ. අරුනයිස් මයා, අංක 55, තලගහමුලවත්ත, කෙන්ගල්ල. |
| | | 06. | බී.ජී ප්‍රේමසිරි මයා, මැණික්හින්න වත්ත, මැණික්හින්න. |
| වගඋත්තරපාර්ශවය | : | 01. | අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී.බී.ජයා මාවත, කොළඹ 10. |
| | | 02. | නේවාසික ව්‍යාපාර කළමණාකරු, නේවාසික ව්‍යාපාර කළමණාකාර කාර්යාලය, වික්ටෝරියා/කොත්මලේ ව්‍යාපෘතිය, දිගන, රජවැල්ල. |

<u>පැමිණිලි අංකය : **HRC/2858/17**</u>

**පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීම :-**

ඉහත නම් සදහන් පැමිණිලිකරු තම පැමිණිල්ලෙන් දක්වා ඇත්තේ, 2005 වසරේ විශේෂ තේරීම් යටතේ අනුමත කර 2014 වසරේ බදු වෙන්දේසියේදී ලබාදුන් කැබලි අංක 09 දරණ වාණිජ්‍ය බිම් කැබැල්ලේ බලපත්‍රය හා භුක්තිය තමා වෙත භාර නොදුන් බවට, හා තමාට මෙන්ම සමාන තත්ත්වයේ තවත්




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / Email: sechrcsl@gmail.com

පැමිණිල්ල සමග සලකා බැලියයුතු ඉහත කී පිඹුරේ කැබලි අංකඃ 4, 5, 6 දරණ බිම් කැබලි වල භුක්තිය භාර නොදීම හේතුවෙන් තමන්ගේ හා තමා සමග යාබද බිම් කැබලි වලට හිමිකම් පෑ පාර්ශවයන්ගේත් මූලික අයිතිවාසිකම් කඩවූ බවට දක්වා ඇත.

තවද 2014 වර්ෂයට හා පෙර වසර වලට අදාළ බදු මුදල් වික්ටෝරියා ව්‍යාපෘති කාර්යාලය වෙත ලබාදුන් බවද, එමෙන්ම ඉඩම තුළ පිහිටි අධිබල විදුලි රැහැන් ට්‍රාන්ස්ෆෝමර් ඉවත් කිරීමට වගඋත්තරකරුවන් විසින් ඉල්ලා සිටි මුදල්ද ලබාදෙන ලද බවද පෙන්වා දී ඇති අතර, මහවැලි සංවර්ධන අමාත්‍යවරයා ලෙස 2016 වසරේ කටයුතු කළ අමාත්‍යවරයා විසින් 2016.08.05 දින දරණ හා අංක එම්ඩීජ්/එල්/එච්ඩී/017 දරණ ලිපියෙන් වික්ටෝරියා කලාපය තුළ රජවැල්ල නව නගරයේ ඉඩම් ලාභීන්ගේ ගැටළු විසඳීමට දන්වා ඇතත්, මේ වනතුරු එය විසඳා නොමැති බව පැමිණිල්ලෙන් දක්වා ඇත. ඒ අනුව පැමිණිලිකරු හා ඔහු සමග මෙම ගැටළුවට මුහුණ දී ඇති පාර්ශවයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරදීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට තම පැමිණිල්ල ගොනු කරන බවද දක්වා ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

පැමිණිල්ල විසින් ඉල්ලා ඇති ඉල්ලීමට අදාළ ඉඩම ලබාදීමට සුදුසු ඉල්ලුම්කරුවන් ලෙස පැමිණිලිකරුද ඇතුළුව 11 දෙනෙකු සුදුසුකම් ලබා ඊට අනුමැතිය ලැබී තිබුණද ඔවුන් වෙත භාරදීමට ප්‍රමාණවත් ඉඩම් කොටසක් දිගන නගරය තුළ නොවූ බැවින්, විදුලි උපාංග සහ ට්‍රාන්ස්ෆෝමරයක් සවිකර තිබූ ඉඩමක් මෙම ඉඩම් ඉල්ලා සිටි අයදුම්කරුවන්ගේ වියදමින් එය වෙනත් ස්ථානයක සවිකොට, පසුව අදාළ ඉඩම මෙම පාර්ශවයන් වෙත ලබාදීම සඳහා අංක 1412/බී දරණ සැලැස්ම සකස් කර ඇති බව දක්වා ඇත.

ඉන් අනතුරුව අදාළ ඉඩම බදු වෙන්දේසියක් මගින් ඔවුන් වෙත භාරදීම සඳහා මූලික කටයුතු සිදු කර ඇති අතර, ඉඩම් වලට අදාළව දළ තක්සේරුවක් මත වාර මුදලක් අයකර ගැනීමක් ද සිදු කර ඇති බව දක්වා ඇත.

එම අවස්ථාව වන විට බදුකරුවන් දෙදෙනෙකු මියගොස් ඇති බැවින් ඉඩම් ලාභීන් නව දෙනෙකු ඉදිරිපත්ව මුදල් ගෙවා ඇති අතර, ශ්‍රී ලංකා පොලිසිය විසින් පොලිස් මුරපොළ ස්ථාවරව ස්ථාපිත කිරීමට පර්චස් 60ක බිම් ප්‍රමාණයක් මෙම දෙපළින් ඉල්ලා තිබී ඇති බවද ඒ අනුව මේ සඳහා ලබාදීමට ඉතිරිව ඇත්තේ, දැනට බෙදාදීමක් සිදු කර නොමැති ඉහතින් සඳහන් කළ 1414/B දරණ සැලසුමට අයත් ඉඩම් කොටස පමණක් බවත් දක්වා ඇත.

**පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-**

මෙම පැමිණිල්ල සම්බන්ධව කොමිෂන් සභාව ඉදිරියේ පැවති පරීක්ෂණ කටයුතු සඳහා වගඋත්තරකරුවන් කිහිප අවස්ථාවකදීම සහභාගී වී නැති බව හා වාර්තා ලබාදීම ද ප්‍රමාද කර ලබාදී ඇති බව නිරීක්ෂණය වේ.

කෙසේ වෙතත්, මෙම ඉඩම් කොටස වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුවන්ට ලබාදීම ප්‍රමාද කිරීමට කරුණු රැසක් ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වන අතර, 2019.04.04 දින ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙතින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා උපදෙස් ඉල්ලා නේවාසික

කලමණාකරු විසින් දැන්වීමක් යවා ඇති බවද පරීක්ෂණයේදී අනාවරණය වේ. එමෙන්ම 2019.12.30 වන දින සහකාර අධ්‍යක්ෂක (ඉඩම්) අයදුම්කරුවන්ට, බදුකරුවන්ට ඉඩම් බෙදා කිරීමට අවශ්‍ය උපදෙස් ද ලබාදී තිබී ඇති අතර, ඉහත කී ලිපිය වික්ටෝරියා කාර්යාලය මගින් අස්ථාන ගත කර ඇති බවක් පරීක්ෂණයේදී කියා සිටින කරුණු අනුව පෙනී යයි. ඒ අනුව 2021.02.09 දින සහකාර අධ්‍යක්ෂක (ඉඩම්) ගේ ඉහත ලිපියේ පිටපතක් සමග නැවත ඉඩම් අයදුම්කරුවන්ට ඉඩම් බෙදා කිරීමට උපදෙස් ලබාදී ඇති බවත්, 2021.03.08 හා 2019.12.30 දිනයන්හි දී මේ පිළිබඳව තොරතුරු දැනගැනීමේ පනත මගින් පැමිණිලිකරුවන් තොරතුරු ඉල්ලා තිබී ඇතත්, එකී තොරතුරු ලබාදී නොදුන් බවත් පැමිණිලිකරුවන් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**නිරීක්ෂණ සහ නිගමන :-**

මෙම පැමිණිල්ලට අදාලව ඉදිරිපත් වී ඇති කරුණු හා වගඋත්තරකරුවන්ගේ කරුණු අනුව, මෙම පැමිණිල්ලේ විෂයගත දේපල අයදුම්කරුවන්ට බදු පදනම මත ලබාදීමට සලකා බලන ලද කටයුතු සියල්ල නියමාකාරයෙන් සිදුව ඇතත්, දේපල භුක්තිය හා බලපත්‍ර පැමිණිලිකරු හා ඔහු සමග පැමිණිල්ලට ඉදිරිපත් වූ යාබද ඉඩම් කැබලි ඉල්ලුම්කරුවන් හටද එකී දේපල කොටස් නොලැබී යාම මත මෙම පැමිණිල්ල ගොනු කිරීම සිදුවී ඇති බවත්ය. වගඋත්තරකරුවන් විසින් ගතයුතු ක්‍රියාමාර්ග නිවැරදි අවස්ථාවේ ගෙන කටයුතු සිදු කර අවසන් පියවරට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වේ.

මෙම බිම් ප්‍රමාණය ඉතා කුඩා කැබලි වලට කොටස් කර පැමිණිලිකරු හා ඔහු සමග අයදුම් කළ පිරිසට ව්‍යාපාරික කඩ කාමර සකස් කර ගැනීමට ලබාදීමට අවශ්‍ය පියවර සඳහා අයදුම්පත් කැඳවා තිබියදී, එකී ස්ථානයට පොලිස් ස්ථානය ස්ථාපිත කිරීමට දේපළ යොදා ගැනීමට කටයුතු කළයුතු බවට ඉල්ලීමක් සිදුව තිබීම මෙම ප්‍රමාදයට ප්‍රධාන හේතුවක් වී තිබී ඇති බවද නිරීක්ෂණය වේ. මෙහිදී මෙම බිම් ප්‍රමාණය වන කුඩා භූමියක් පොලිස් ස්ථානයක් ස්ථාපිත කිරීමට කිසිසේත් නොගැලපෙන බව බැලූ බැල්මට නිරීක්ෂණය කළ හැක.

2021.11.20 දින කුණ්ඩසාලේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී, දිගන නගරයට නව පොලිස් ස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා සුදුසු ගොඩනැගිල්ලක් හෝ බිම් කොටසක් ලබාදෙන ලෙස තෙල්දෙණිය, මූලස්ථාන පොලිස් පරීක්ෂක විසින් කළ ඉල්ලීමට වඩාත් සුදුසු වන්නේ දිගන වෘත්තීය පුහුණු අධිකාරිය පවත්වාගෙන යන ගොඩනැගිල්ල පිහිටි භූමිය වන බවත් දක්වා ඇත.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පරීක්ෂණ කටයුතු අවසන් වනවිට පොලිස් ස්ථානය පිහිටුවීමට සුදුසු ස්ථානයක් ලැබී ඇති බැවින් ,මෙම අයදුම්කරුවන් විසින් ඉල්ලා ඇති සහනය ලබාදීමට බාධාවක් නොමැති බව ද නිරීක්ෂණය වේ.

මෙම කරුණු අනුව පැමිණිලිකරුවන් වෙත ලබාදිය යුතු සහනය ලබාගැනීමට ඇති අයිතිවාසිකම් වසර 07ක පමණ කාලයක් ප්‍රමාද වී ඇත්තේ, වගඋත්තරකරුවන්ගේ පරිපාලන හා විධායක ක්‍රියා හේතුවෙන් බව පෙනී යන අතර, ඒ අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව, වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය හේතුවෙන 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට අනාවරණය වී ඇති බැවින්,

1. පැමිණිලිකාරිය හා අනිකුත් මෙම විෂයගත දේපළ අයදුම් කළ සුදුසුකම් ලාභීන් බවට දැනට තේරී පත්ව සිටින අයදුම්කරුවන් හට දේපළ සඳහා හිමි බලපත්‍රද භුක්තියද ලබාදීමට කඩිනමින් කටයුතු කරන ලෙස ද,

2. 2015 වසරේ හෝ ආසන්න කාලයක සිට මෙම විෂයගත දේපළ සඳහා අයදුම් කර ඉදිරිපත්ව සිටි අයදුම්කරුවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරයට වෙනත් තැනැත්තන් හෝ ආයතන වෙත දේපළ බැහැර වන ආකාරයට නැවත අයදුම්පත් කැඳවීම, පරීක්ෂණ පැවැත්වීම හෝ එවැනි ආකාරයේ යම්කිසි ක්‍රියාවක් මගින් පැමිණිලිකරු හා අනිකුත් පැමිණිල්ලේ පාර්ශවයන් ලෙස ඉදිරිපත්ව සිටි තැනැත්තන් හට බිම් කොටස් ලබාගැනීමට අයිතිවාසිකම අහිමි වන ආකාරයේ කිසිදු ක්‍රියාවක් සිදු නොකළයුතු බවටද වගඋත්තර පාර්ශවය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023.01.23 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ආචාර්ය ගේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත :- අමාත්‍යතුමා,
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය,
500, ටී.බී ජයා මාවත,
කොළඹ 10.

B/